# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2308/24 - 2022 දෙසැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 9/3/1/2017/02.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමුව* : 4-3/9/2017/WS/322.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශතාවේ විස්තර* :-

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 54 බී කොටදෙනියාව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ කොටදෙනියාව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද 2022.06.20 දිනැති කඩයිම් සිතියම් අංක 510045 (කලාප 2) හා පත්‍රය 1හි කැබලි අංක 25 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0956ක් වූ පහත සඳහන් ඉඩම :

**01. කැබලි අංක 25**

ඉඩමේ නම: ඇටඑවාහේන සහ තේක්කලන්ද; විස්තරය: ගෙවත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: සොයාගත නොහැක ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ පවරා ගන්නා ලදි. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0956.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 දෙසැම්බර් මස 28 වැනි දින පෙ.ව. 10.00ට දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 දෙසැම්බර් මස 19 වැනි වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම / පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**ඩබ්. ඩබ්. එම්. ඩී. කුමාරි,**
ප්‍රාදේශීය ලේකම් ,
දිවුලපිටිය කොට්ඨාශය.

2022 නොවැම්බර් මස 30 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12—0011

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 11/9/2/නයාබැඳි ඇළ/C 9.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/8/2021/UD/49.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශතාවේ විස්තර* :-

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 251, 2 පියවර 1 කොටස ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, II පියවර ගමේ (කොට්ඨාස අංක 9, අනුරාධපුර මහා නගර සභා සීමාව තුළ) පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙළ කරන ලද 2022.09.29 දිනැති අවසාන නගර පිඹුර අ 3හි අතිරේක අංක 331හි පත්‍ර අංක 331හි කැබලි අංක 4485, 4486, 4492, 4494 සහ 4495 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0139ක් වූ පහත නම්වලින් හා මායිම්වලින් යුත් බිම් කොටස් (05) :

**01. කැබලි අංක 4485**

ඉඩමේ නම: -; ඉඩම් පරිහරණය: නයාබැඳි ඇළ; හිමිකම් කියන අය: රජය ; මුල් හිමිකම්පාන්නා: -; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0518ක් පමණ වේ.

**02. කැබලි අංක 4486**

ඉඩමේ නම: කොම්බිච්චිකුලම හේන; ඉඩම් පරිහරණය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: -; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0128ක් පමණ වේ.

**03. කැබලි අංක 4492**

ඉඩමේ නම: කොම්බිච්චිකුලම හේන; ඉඩම් පරිහරණය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක්, ආධාරක තාප්පයක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය ; මුල් හිමිකම්පාන්නා: ඊ. එම්. අමරසේකර විසින් අයුතු ලෙස අල්ලාගෙන භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0185ක් පමණ වේ.

**04. කැබලි අංක 4494**

ඉඩමේ නම: -; ඉඩම් පරිහරණය: නයාබැඳි ඇළ; හිමිකම් කියන අය: රජය ; මුල් හිමිකම්පාන්නා: -; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0391ක් පමණ වේ.

**05. කැබලි අංක 4495**

ඉඩමේ නම: කොම්බිච්චිකුලම හේන; ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය ; මුල් හිමිකම්පාන්නා: -; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0168ක් පමණ වේ.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 දෙසැම්බර් මස 22 වැනි දින පෙ.ව. 9.00ට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 දෙසැම්බර් මස 15 වැනි වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම / පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**ඊ. එම්. ආර්. පී. බී. ඒකනායක,**
ප්‍රාදේශීය ලේකම් ,
නැගෙනහිර නුවරගම් පළාත,
අනුරාධපුර.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0012

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.